# කොටි ළමා සොල්දාදුවන් 251කට බස්නාහිරෙන් විශේෂ පාසලක්

□ ඉෂාර රත්නකාර

දැනට ආරක්ෂක අංශ භාරයේ සිටින පාසල් යා යුතු වයසේ එල්.ටී.ටී.ඊ. ළමා සොල්දාදුවන් 251 දෙනකුට සිය අධ්‍යාපන කටයුතු නිසියාකාරව හැදෑරීම සඳහා බස්නාහිර පළාත තුළ විශේෂිත පාසලක් ස්ථාපිත කිරීමට අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය තීරණය කර ඇත.

ආරක්ෂක අංශ භාරයේ මේ වන විට එල්.ටී.ටී.ඊ. ළමා සොල්දාදුවන් 575 දෙනකු සිටින අතර, එයින් 251 දෙනකු පාසල් යා යුතු වයසේ සිටින බව අනාවරණය වී තිබේ.

මෙම විශේෂිත පාසල තුළ අධ්‍යාපන කටයුතුවලට අමතරව පරිගණක, කාර්මික ආදී ක්ෂේත්‍ර ගණනාවක පුහුණුවද එල්.ටී.ටී.ඊ. ළමා සොල්දාදුවන්ට ලබා දීමට නියමිත අතර, අදාළ වැඩපිළිවෙළ අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතාගේ උපදෙස් පරිදි පුනරුත්ථාපන කොමසාරිස් කාර්යාලය ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම විශේෂිත පාසල ගොඩනැගීම සඳහා අවශ්‍ය වන මූල්‍යාධාර ලබා ගැනීමේදී දෙමළ ප්‍රජාව ප්‍රමුඛතාවයක් ගෙන කටයුතු කරන බවත්, ඒ සඳහා දෙමළ ප්‍රජාවගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් මේ වන විට පිහිටුවා ඇති බවත් අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු "ලක්බිම"ට පැවැසීය.